# මහජනතාව වෙත කෙරෙන දැනුම්දීමයි.

## තෝරාගැනීමේ පරීක්ෂණය- නීතිවේදී උපාධි පාඨමාලාව
## ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මෙය 2021.11.14 වන දින පවත්වන ලද ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය නීතිවේදී උපාධි පාඨමාලාව සඳහා තෝරාගැනීමේ පරීක්ෂණය සම්බන්ධයෙන් 2021.11.14 සහ 2021.11.15 දිනයන් හි විද්‍යුත් මාධ්‍යවල විකාශය වූ ප්‍රවෘත්තිය හා බැඳේ.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අතර අත්සන් කරන ලද ගිවිසුමකට අනුව ඉහත සඳහන් තෝරාගැනීමේ පරීක්ෂණය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද බව මහජනතාව වෙත මෙයින් දන්වා සිටිමි. මෙම ගිවිසුමේ විධිවිධාන වලට අනුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ඉහත සඳහන් විභාගයේ ප්‍රශ්න පත්‍ර සැකසීමේ සහ එම විභාගය දිවයින පුරා පැවැත්වීමේ වගකිවයුතු බලධාරියා වේ.

මේ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් කල විමසීමේදී මෙයට අදාළව පූර්ණ පරීක්ෂණයක් ඔවුන් විසින් ආරම්භ කිරීමට නියමිත බව අප වෙත දන්වන ලදී.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
2021.11.16